**චක්‍රලේඛ අංක: 35/01/005/0010/22** 2018 නොවැම්බර් 26

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත**

## මෝටර්රථ වාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ අයිතම ආනයනය සඳහා වන ණයවර ලිපි මත ආන්තික අවශ්‍යතාව

ඉහත කරුණ සම්බන්ධව 2018 සැප්තැම්බර් 29 දිනැති අංක 35/001/005/0010/21 දරන චක්‍රලේඛය හා බැඳේ.

මෝටර්රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ විදේශ මුදල් ගිණුම් හරහා ආනයනය කිරීමේදී ඊට අදාළ ණයවර ලිපි විවෘත කරන විට තැබිය යුතු අවම ආන්තික අවශ්‍යතාව සියයට සියයක් බව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙමගින් තවදුරටත් දැනුම් දෙනු ලබයි.

විදේශ මුදල් ගිණුම් හරහා ණයවර ලිපි විවෘත කරනු ලබන අවස්ථාවකදී අදාළ වන කොන්දේසි පහත පරිදි වේ.

1. බැංකුවෙහි පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුමෙහි පවත්වා ගනු ලැබූ ආන්තික තැන්පතුව භාවිතා කොට ආනයන බිල්පත සඳහා ගෙවීම් කළ යුතුය.
2. ණයවර ලිපි විවෘත කිරීමේදී අයිතමයේ වටිනාකමට වඩා අඩුවෙන් ඉන්වොයිසිය විවෘත නොකළ යුතුය.
3. 2018 සැප්තැම්බර් 29 දිනැති අංක 35/001/005/0010/21 දරන චක්‍රලේඛයෙහි අඩංගු කොන්දේසි

2018 නොවැම්බර් 26 දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු නැවත දැනුම්දෙන තුරු මෙම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**